(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 19]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 සැප්තැම්බර් මස 09 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0053/'08

1.

ගරු රවි කරුණානායක මහතා,—මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය යනු 1891 අංක 5 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥා පනත යටතේ සංස්ථාගත කර ඇති ශතවර්ෂයක් පැරණි ව්‍යවස්ථාපිත මූල්‍ය ආයතනයක් බවත්;

(ii) කාරක සභාවේ සභාපති, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් පත්කරනු ලැබූ නම් කළ සාමාජිකයින් දෙදෙනෙක් හා ඡන්ද විමසීමක් මගින් තෝරා පත්කර ගන්නා ලද කාරක සභා සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත වන කාරක සභාවක් මගින් එය පාලනය කරනු ලබන බවත්;

(iii) එහි කාර්යාලය සඳහා රුපියල් මිලියන 48ක වියදමින් ගොඩනැගිල්ලක් මිල දී ගෙන තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විකුණුම්කරු හා ගැනුම්කරු අතර ඇතිකරගත් අංක 2921 දරන ගිවිසුමට අනුව රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය වෙනුවෙන් "මිල දී ගත් දේපලේ පූර්ණ අයිතිය" මාසයක කාලයක් ඇතුළත ජාතික නිවාස කොමිසමෙන්, විකුණුම්කරු ලබා ගන්නා තෙක් රුපියල් මිලියන 7ක මුදලක් රඳවුම් මුදලක් ලෙස තැබුවේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2006 වර්ෂය සඳහා වූ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ ගිණුම් පිළිබඳ වාර්තාවේ විගණකාධිපතිවරයා පෙන්වා දී ඇති ආකාරයට දැනට වසර 3 ½ කට වැඩි කාලයක් ගත වී ඇති නමුත් රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය වෙනුවෙන් "දේපලේ පූර්ණ අයිතිය " තවමත් ලබාගෙන නැති බවත්;

(ii) රඳවුම් මුදලින් මිලියන පහක මුදලක් හෙළි නොවූ හේතූන් මත ගෙවා ඇති බවත්:

එතුමා දන්නෙහිද?

(ඈ) මේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්වීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0078/'08

2.
ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද මුලු මුදල් ප්‍රමාණයන් කොපමණද;

(ii) පරිගණක මිල දී ගැනීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහක කාලය තුළ රජය විසින් පරිගණක සැපයුම්කරුවන්ට සහ පරිගණක මෘදුකාංග සැපයුම්කරුවන්ට ගෙවා ඇති මුදල කොපමණදැයි එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) රජය විසින් ඔවුන් වෙත ගෙවිය යුතු මුදල් නොගෙවීම හේතුවෙන් සැපයුම්කරුවන් ගණනාවක් බංකොලොත්වී හෝ මූල්‍ය අර්බුදයට පත් වී සිටින බව එතුමා දන්නෙහිද?

(ඈ) ඔවුන්ට මුදල් ගෙවීමට නියමිත දිනය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0079/'08

3.
ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ක්‍රියාත්මකව පවතින සියලුම ඍජු සහ වක්‍ර බදු කවරේද;

(ii) අද වන විට බදු ක්‍රියාත්මක අනුපාතිකයන්ගේ බලපෑමෙහි රුපියල් අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අද වන විට සහල්, සීනි, පරිප්පු, කිරි පිටි, තිරිඟු පිටි, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ටින්මාලු, ළූණු, විදුලිය සහ බැංකු ණය මත පනවනු ලබන සියලු බදු කවරේද;

(ii) 1. 1994 අගෝස්තු 15 වැනි දින,

2. 2001 දෙසැම්බර් 15 වැනි දින,

3. 2004 අප්‍රේල් 02 වැනි දින,

4. 2005 දෙසැම්බර් 01 වැනි දින,

5. අද දින,

වන විට එම අගයන්හි සංසන්දනයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එමෙන්ම අද වන විට බදු ක්‍රියාත්මක කිරීමේ අනුපාතිකයන්ගේ බලපෑමෙහි සම්පත් අගය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0147/'08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තු 2008 සඳහන් පරිදි) මගින්, නගර තිරසාර බවට පත් කිරීමට නාගරික ප්‍රජාව සඳහා පහසුකම් සැපයීම යටතේ රුපියල් මිලියන 1489 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0148/'08

5.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ අයවැය මගින්, සුනාමියෙන් විපතටපත් ප්‍රදේශවල ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 1712ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවල ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0149/'08

6.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තු 2008 සඳහන් පරිදි) මගින්, සුනාමියෙන් විපතටපත් ප්‍රදේශවල ජල සම්පාදන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 3169 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවල ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0195/'08

7.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ගොවි ජනපදයට ජලය සපයන විලච්චිය වැව හා වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කරන ලද දිනය හා ගොවි ජනපදය පිහිටුවන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගොවි ජනපදයට ජලය සපයන අදාළ වැවේ ධාරිතාවය අක්කර අඩි කොපමණද;

(ii) එමගින් වගාකරන කුඹුරු ප්‍රමාණය කොපමණද;

(iii) විලච්චිය ව්‍යාපාරය යටතේ 2005, 2006 හා 2007 වර්ෂවල යල හා මහ කන්න සඳහා වගාකළ බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම වැවේ අබලන් වාරිමාර්ග පද්ධතිය හේතුවෙන් ගොවිබිම් වලට ප්‍රමාණවත් ලෙස ජලය නොලැබෙන බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම වැවේ වාරිමාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0196/'08

8.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ගොවි ජනපදයට ජලය සපයන කන්තලේ වැව හා වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කරන ලද දිනය හා ගොවි ජනපදය පිහිටුවන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගොවි ජනපදයට ජලය සපයන අදාළ වැවේ ධාරිතාවය අක්කර අඩි කොපමණද;

(ii) එමගින් වගාකරන කුඹුරු ප්‍රමාණය කොපමණද;

(iii) කන්තලේ ව්‍යාපාරය යටතේ 2005, 2006 හා 2007 වර්ෂවල යල හා මහ කන්න සඳහා වගාකළ බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම වැවේ අබලන් වාරිමාර්ග පද්ධතිය හේතුවෙන් ගොවිබිම් වලට ප්‍රමාණවත් ලෙස ජලය නොලැබෙන බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම වැවේ වාරිමාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0517/'08

9.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පර්යේෂණාගාර සංඛ්‍යාව හා ඒවා පිහිටා තිබෙන ස්ථාන කවරේද;

(ii) එම පර්යේෂණාගාර මගින් සිදුකරන පර්යේෂණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදන අංශ පිහිටා තිබෙන ස්ථාන සහ නිෂ්පාදනය කරන බීජ වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006/2007 වර්ෂවල ඉහත බීජ නිෂ්පාදන අංශ මගින් ගොවීන්ට නිකුත් කළ බීජ නිෂ්පාදන හා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වර්ෂවල ආනයනික බීජ වර්ග හා ප්‍රමාණයන් කවරේද;

(iii) පුද්ගලික අංශයේ බීජ නිෂ්පාදනය කරන ආයතන හා අදාළ බීජ වර්ග කවරේද;

(iv) එම සමාගම් විසින් 2006/2007 වර්ෂවල දේශීය වෙළඳ පොළට නිකුත් කළ බීජ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0525/'08

10.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රීමා ආයතනය වෙත තිරිඟු පිටි සඳහා රජය විසින් සහනාධාරයක් ලබාදී තිබේද;

(ii) එසේනම් පිටි කිලෝග්‍රෑමයක් සඳහා අදාළ සහනාධාරය කොපමණද;

(iii) එම සහනාධාරය ලබාදීමට කටයුතු කළේ කවදා සිටද;

(iv) එය අත්හිටවූයේ කවදාද;

(v) එම කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සහනාධාර ලෙස ලබාදෙන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වර්ෂය සඳහා නියමිත සහනාධාර මුදල්, ප්‍රීමා සමාගම වෙත ලබාදෙන ලද දිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0527/'08

11\.

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මිහින් එයාර්" ගුවන් සමාගම සතු ගුවන් යානා මිල දී ගත් ඒවාද, නොඑසේනම් බදු පදනමින් ලබාගත් ඒවාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිල දී ගත් ගුවන් යානා නම්, අනුගමනය කළ මිල දී ගැනීමේ පටිපාටිය කවරේද;

(ii) මිල දී ගනු ලැබුවේ කවර මිල ගණන් වලටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බදු පදනමින් ලබාගත් ගුවන් යානා වේ නම්, බදු පදනමින් ලබාගත්තේ කවදාද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේ නම් ඒ කවදාද;

(iii) එලෙස ගනු ලැබූ ගුවන් යානා සඳහා මුදල් ගෙවනු ලබන පදනම, ගෙවනු ලබන මුදල් ප්‍රමාණය සහ අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) බදු පදනමින් ගනු ලැබූ ගුවන් යානා සඳහා මෙතෙක් ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය එක් එක් මාසය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හිඟ මුදල් තිබේ නම් ඒ කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'08

12\.

ගරු අනුර දිසානායක මහතා,—උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශ්වවිද්‍යාල සඳහා ළමුන් ඇතුළත් කරගන්නා ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) දැනට උසස් පෙළ විභාග සඳහා නියමව ඇති සාමාන්‍ය පොදු පරීක්ෂණයේ අරමුණ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම සඳහා එම පොදු පරීක්ෂණය සමත්වීම අනිවාර්යවේද;

(ii) එසේ නම්, එසේ කළේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2006 සහ 2007 වර්ෂවලදී පොදු පරීක්ෂණය අසමත් එහෙත් උසස් පෙළ විභාගය සමත් වූ ළමුන් සඳහා Z - score අගය ප්‍රකාශයට පත්කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0722/'08

13.

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සහ ඊට මායිම්ව දැනට තිබෙන විදුලිබලය උත්පාදනය කරන රජයේ සහ පෞද්ගලික විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද ;

(ii) එම එක් එක් විදුලි බලාගාරය මගින් වාර්ෂිකව නිපදවන විදුලි ඒකක ප්‍රමාණය කොපමණද ;

(iii) එම එක් එක් බලාගාරය ඉදිකිරිමේ දී ජලාශ හා අනෙකුත් ඉදිකිරීම් වෙනුවෙන් වෙන්කර ඇති භූමි ප්‍රමාණය සහ ඉවත්කළ පවුල් සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විදුලිබලය නොමැති ග්‍රාමනිලධාරී වසම් සංඛ්‍යාව සහ විදුලිය නොලැබූ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් ව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අඩු වෝල්ටීයතාවයෙන් යුත් විදුලිය සහිත ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව සහ අදාළ පවුල් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ඉහත විදුලිය නොමැති හා අඩු වෝල්ටීයතාවය සහිත ප්‍රදේශවල අවශ්‍යතා සපුරාලීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට කටයුතුකර ඇති චීන ආධාර ඇතුළු "සීඩා" ව්‍යාපෘතිය හා වෙනත් විදුලි ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙන්කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0723/'08

14.

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරී තනතුරෙහි සිටිමින් ගුරු වෘත්තියෙහි ද යෙදෙන සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ වැටුප් ගෙවීම සඳහා සමෘද්ධි ව්‍යාපාරය මගින් මාසිකව යොදවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එකී සමෘද්ධි ගුරුවරුන්ට පත්වීම් ලබාදීමේ දී අදාළ කරගත් අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) බඳවා ගන්නා අවස්ථාවේ දී එක් එක් සමෘද්ධි ගුරුවරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) ඔවුන් තවදුරටත් අදාළ තනතුරෙහි සේවයෙහි යොදවන්නේද;

(iv) නොඑසේ නම් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත කරන්නේද; සහ

(v) මොවුන්ගේ ගුරු වෘත්තිය සංවර්ධනය කිරීම සඳහා ගෙන තිබෙන සහ ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0724/’08

15.

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් රු. 1000/-, රු. 500/-, රු. 300/- සහ රු. 140/- දීමනා ලබන සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොපමණද;

(iii) ඒ අනුව, සමෘද්ධි ප්‍රතිලාභීන්ට ගෙවන මුලු මුදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කයේ සමෘද්ධි ව්‍යාපාරය තුළ සේවයේ නියුතු සමෘද්ධි කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන් සහ වෙනත් තනතුරු දරන අය වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(ii) ඔවුනට ගෙවන මාසික වැටුප් හා දීමනා සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒවායේ එකතුව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති සමෘද්ධි බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් සමෘද්ධි බැංකුවේ ගිණුම්වල ඉතිරි කිරීම් ප්‍රමාණය සහ ප්‍රතිලාභීන් සඳහා ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iii) අදාළ ණය ලාභීන් සහ නොගෙවා ඇති ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,—ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ),—1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහා ද, 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීමට ආනුෂංගික විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

2.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන),— 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන),— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2008.06.05 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2008 සැප්තැම්බර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 142— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහ අටකට (රු. 18,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 142 | — | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | | |
| ව්‍යාපෘතිය | 3 | — | සමාජ සංස්කෘතික ඒකාබද්ධව කටයුතු කිරීම | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 18,000,000 |
| | | | මුළු වියදම | රු. | 18,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 3,198,180,332.

*3.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නියෝගය (අංක 1),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 සහ 3 වැනි වගන්ති යටතේ ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 මාර්තු මස 28 දිනැති අංක 1543 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*4.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ නියෝගය (අංක 2),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 සහ 3 වැනි වගන්ති යටතේ ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 අප්‍රේල් මස 07 දිනැති අංක 1544/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.07 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*5.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය,— 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*6.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ සහ 23 ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

අධ්‍යාපන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 212— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හාරසිය හතළිස් එක් මිලියන අටසිය දහසකට (රු. 441,800,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 212 | — | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන ක්‍රියාකාරකම් | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 441,800,000 |
| | | | ප්‍රාග්ධන වියදම් | රු. | — |
| | | | එකතුව | රු. | 441,800,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 අගෝස්තු මස 22 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 5 දක්වා එකතුව රුපියල් 15,070,180,332.

*8.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*12.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*15.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*16.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*17.
සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*18.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*19.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.
ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*22.
ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඕ) සහ (ක) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 දෙසැම්බර් මස 17 දිනැති අංක 1528/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.
නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජුනි මස 27 දිනැති අංක 1555/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*24.
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*26.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*27.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*33.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

34.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.